# කාව්‍ය ශේඛරයේ චරිත නිරූපන තත්ත්වය

ගරු තොටවියේ සෝමානන්ද හිමිපාණෝ

කාව්‍ය ශේඛරය සිරිරහල් හිමියන්ගේ කෘතියකි. එය පොදු බෞද්ධ ලෝකයාගේ සම්මානයට භාජන වූ පන්සිය පනස් ජාතකපොතේ එන සත්තුභත්ත ජාතකය වස්තු කරගෙන ලියා ඇත. උලකුඩය දේවියට සිංහලෙන් බණක් කියන්නට සූදනම්වූ සිරි රහල් මාහිමි ගිහි ජීවිතයේ එක් අංශයක් විවරණ කිරීමටද එයම අවස්ථාව කරගත් බව පෙනේ. මෙහි එන චරිත අතර,

i සේනක චරිතය,

ii මහලු බමුණකුගේ චරිතය,

iii තරුණ බැමිණියකගේ චරිතය.

යන චරිත තුනට මුල් තැන ලැබී ඇත. ඒ හැරුණු විට හොරහිමි චරිතය, රුක් දෙවි චරිතය, ආදී අතුරු චරිත කීපයක් නිරූපනය වී ඇත. අතුරු චරිත ඒ ඒ තැනට ගැළපෙන අයුරින් නිරූපනය කර ඇති අතර සේනක චරිතය ග්‍රන්ථයේ ආරම්භයේ පටන් අග තෙක්ම ගමන් කරයි.

සේනක බෝසත් කෙනකු බව නිතර සිහි තබා ගෙන තම කටයුත්තෙහි යෙදුන රහල් මාහිමි එය ප්‍රඥාවීර චරිතයක් ලෙස නිරූපනය කර ඇත. සේනක උපතින් පටන් ගන්නා වස්තු විකාශනය සොර සැමියාට කළ දේශනයෙන් අවසන් වේ.

සේනක කුමරුගේ ළදරු විය පිළිබඳව විස්තර කරන රහල් හිමි එය ස්වභාවෝක්තියේ මුදුන් පෙත්තෙන්ම නිරූපනය කර ඇත.

| | |
|---|---|
| දත් කැකුළු | පැලා |
| සුරතල් සිනා | සීලා |
| බොලඳ බස් | දීලා |
| කෙළි සියලඟ දූලි | ගාලා |

දණගාන වයසේ කුඩා දරුවකු සෙල්ලම් කරන සැටි දක ඇති ඕනෑම කෙනකුට මේ කවියෙන් සේනක කුමාරයා මැවී පෙනෙනු නොඅනුමානය. එය එතරම්ම ස්වාභාවිකවූද තාත්විකවූද කියමනෙකි. සේනක කුමරුගේ ළමා චරිතය නිරූපනය කළ ඡේදය වත්සල රසය දනවයි. එකුමරු නොමද සව් ඉසුරෙන් වැඩුන බව පෙන්වීමට " නවසඳ " උපමා කර ඇත. යමක් සියල්ලෙන් සම්පූර්ණව ක්‍රමයෙන් වැඩෙන බව දක්වීම සඳහා පැරණි බොහෝ කව්හු නවසඳ උපමා කළහ. සව් ඉසුරෙන් පමණක් නොව සච්චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳ සංකෙතයක් බඳු සේනක කුමරු අධ්‍යාපනික කටයුතු සඳහා තක්ෂිලාවට යන්ට පිටත්වීම දෙමව්පියන්ට ඉවසිය නොහැකි දුකක් වූ බව,

| | |
|---|---|
| දෙමව්පිය සෙනෙ | හැති |
| වඩිනුව පාපියුම් | පෙති |
| එකුමරු නැමී | ගති |
| ඔවුන් කඳුලෙන් පිට තෙමී | ගති |

යනුවෙන් පැහැදිලි කර ඇත. සේනක කුමරුගේ ශිෂ්‍ය ජීවිතයද ඉතාම ආදර්ශවත් එකක් විය. සේනක බෝසත් කෙනකු බව අමතක නොකළ රහල් මාහිමි එයද සාමාන්‍ය ශිෂ්‍යයකුගේ චරිතයට වඩා උසස් අයුරින් දක්වා ඇත.

'' ගුරු සිත නොරිදවා වේලාව නොවරදවා '' උගත් සේනක උසස් බුද්ධි ප්‍රභාවයකින් යුත් නිසාම තම ඉගෙනීමේ කටයුතු,

පෙතෙල්ලෙන් ඇවූ එ
පහනෙව් වතුන් අලුක එ
ගුරුනුදු නොම හස එ
කුමරු සත දන යසින් සුළු කු එ

ඉතා ඉක්මනට අවසන් කරගත් සැටි අද්භූත රසය දනවමින් විවරණය කර ඇත. ගුරුසිත දිනා ගෙන සෙසු ආශ්‍රිතයන්ගේ සිත් දිනාගෙන ගුරුසිත ලෙස පැවති සව්සත ගෙවා දනගත් සේනක කුමරු ගුරුනුදු නොදත් දෙය උගත්තේයැයි කීමෙන් සේනක කුමරුගේ බුද්ධි ප්‍රභාවයත් ධාරණ ශක්තියත් බෝධිසත්ව කෙනකුට සුදුසු අයුරින්ම පැවති බැව් කතු හිමියෝ ධ්වනිත කරති.

ඉගෙනීමේ කටයුතු අවසන් වන කාලය වන විට හේ තරුණ වියටද පත්වූවෙක් විය.

රුවින් ගුණ නැණෙනි දූ
වැඩිණි මහසත් වෙමිනි පරසි දූ

යනුවෙන් එම අවස්ථාව නිරූපනය කරන කාව්‍යශේඛර කතෘතුමා සේනක කුමරුගේ විවා මංගලය පිළිබඳ කථාවද මැනවින් නිරූපනය කර ඇත. තමන්ට හුරු පුරුදු නැති යම් දෙයක් ගැන කථා කරන්නට හෝ විස්තර කරන්නට යන විට ඒ සඳහා තමාගේ ඇසූ හෝ කියවූ දැනුමෙන් ප්‍රයෝජන ගැනීම නොකරම බැරි දෙයකි.

සේනක කුමරුගේ විවා මංගලය විස්තර කරන්නට ගිය රහල් මාහිමියන්ද සංස්කෘත සාහිත්‍ය කෘති කියවා තමා ලද දැනීමෙන් ප්‍රයෝජන ගෙන ඇති බව පෙනෙන්නේ එහෙයිනි. එනිසාම කාව්‍යශේඛරයේ එන විවාහ මංගලය නියම හින්දු විවාහ මංගලයක ස්වභාවය ගෙන ඇත.

සේනක චරිතය හැරුණු විට මෙහි එන ඉතාම වැදගත් චරිතය නම් මහලු බමුණාගේ චරිතයයි. එය ගිහි ජීවිතයේ එක් අංශයක් පිළිබඳ ඉතාම අගනා විවරණයක් බඳුය. තම වයස ගැන නොතකා ලෞකික වස්තූන් පිළිබඳව පාලනය කරගත නොහැකි ආසාව නිසා තරුණියන් විවාහ කර ගන්නා අයට මහලු බමුණාගේ චරිතය උපහාසයක් බඳුය. සමාජයේ පොදු දුර්වලතාවක් ලෙස පෙනෙන මෙය රහල් හිමියන් අතින් මනාලෙස ප්‍රකට වී ඇත. රහල් මාහිමියන් මහලු බමුණා පිළිබඳ කථාව 10 වැනි සර්ගයෙන් පටන් ගන්නේ මෙසේය.

එකලෙක්තරා එ ක්
දුප්පත් මහලු බමුණෙ ක්
තැතින් කර දන බි ක්
ලදී කහවනු පමණ දහස ක්

මහලු බමුණා සිඟා ඇවිදීමෙන් ලද කහවනු දහස තවත් එවැනි දුප්පත් බමුණකු ළඟ තැබීය. එය ඔහුට වියදම් විය. දුගී බමුණු තම කහවනු එහි ප්‍රවේශමට තබද්දී ඒවාට කුමක් වේද, ඉන් පසු කුමක් කටයුතුද ? යන මේ කරුණු පිළිබඳව එක්තරා ප්‍රමාණයකට හෝ සිතා මතා සිටි බව මේ පද්‍යයට නගන කතු හිමි ව්‍යංගයෙන් අඟවයි. තමා ළඟ රැකවරණයට තිබූ කහවනු තමාට වියදම් වූ නිසා එය තමාට ගෙවා ගත නොහැකි නිසා ඒ වෙනුවට තම රුමත් දියණිය පෙන්වා මේ මගේ දියණිය ඔබට අත් පා මෙහෙවරට හොඳදැයි,

දක්වාලා ඔහු ට
අත් පා මෙහෙ කිරීම ට
මැනවිද පින්වතු ට
කියා පිළිවිසියෝ දෙදෙන සි ට

ආදි වශයෙන් විමසූ සැටි ප්‍රකට කළ කතු හිමි එද පැවැති වහල් වෙළඳාම පිළිබඳ පැරණි චාරිත්‍රය දෙසටද ඉඟියක් කරයි. මුදල් තැන්පත් කරද්දී යමක් සිතුවා නම් එය මුදුන් පැමිණීම නිසා බමුණා ප්‍රීත වූ සැටි අසන්නාට සිනහ උපදවන සුලුය.

එය බමුණා කලක්ම බලාපොරොත්තු වූ දෙයක් බව

නොලදත් ඒ දහ ස
සිදු වූ හෙයින් අදහ ස

යන පදාර්ථයෙන් විවරණ කරන කතු හිමි හැටපිරි මහල්ලකු වූ තමාට සොළොස් හැවිරිදි තරුණියක් ලැබීමෙන් උද්දාම වූ මහලු බමුණා එම තරුණිය දෙස යටින් බලා සිනාසෙන හැටි

"විඳිමි රස පහ ස
එළඳ දූක මහලු කර මදහ ස"

යනුවෙන් පිළිබිඹු කරයි. එහෙත් තම සිතේ පැවැති කැදරකම මදකටවත් ප්‍රකට නොකළ මහල්ලා තමාට අවශ්‍ය නැතත් හිතවත්කමත් යුතුකමත් ලොකු නිසා භාරගන්නා බව කියයි.

ඉත පුරුදු පෙර ක ල
දූන් කොප මෙසේ කී ක ල
නොකොට තව කොලහ ල
සොඳයි පාවා ගනිමි මනක ල

කවියා මෙතැනදී තම තියුණු බුද්ධියත් ශ්‍රේෂ්ඨ ප්‍රතිභානයත් ප්‍රකට කර ඇත. එහෙත් එයින් පසු එන පියා දුවට දුන් අවවාදය නම් එතරම්ම යෝග්‍ය නැති බව සමහර විචාරකයෝ කියති. එහෙත් එය වත්මන් සමාජයට එල්ල කළ ඊ පහරක් බඳුය. පියාගේ අවවාදය හා වෙනත් නානා හේතු නිසා ටික දිනක් නාකි බමුණා සමහ විසූ තරුණිය ඔහුගෙන් තෘප්තියකට පත් නොවුණි. ගමේ ගොඩේ කෙල්ලන්ගේ උසුළු විසුළු මැද සියා කෙනකු වැනි මහල්ලා සමහ මධු සමය මහා නොකැමැත්තෙන් ගතකළ තරුණිය බැරිම තැන " යොවුන් බමුණකු කළේ ඇස්හමු " පියාගේ අවවාදයට පිටුපෑමිනි. එයින් පසු ඈ එම තරුණයා සමහ කිප විටක්ම " සමග විසුවා හිමිට රහසින් " මේ ජවනිකාව අවසන් වන්නේ බමුණා ගෙදරින් පිට කිරීමෙනි.

තමාට දාසයන් ගෙනෙන ලෙස ඉල්ලන්ට වූයේ එයින් පසුවය. තමාට ඒ සඳහා නිසි ධනයක් නැති නිසා මහලු බමුණා සොඳුර " මවිසින් මෙහෙ කරනු මිස " වෙන කළ හැකි අන්දෙයක් නැති යයි කී නමුදු එය අසාර්ථක විය. තරුණියට උවමනා කළේ දාසියන් නොවේ. මහල්ලා ගෙයින් පිටමන් කර ගැනීමය. එය එසේම සිදුවිය.

මෙතැනදී මහලු බමුණා හැසිරෙන අයුරු පාඨකයා හමුවේ මවා පෑමට රහල් මාහිමියන් සමත් වී ඇත. " සඳවැනි " මුහුණක් ඇති ඇයගෙන් වෙන්වීම නම් කෙසේවත් කළ හැකි දෙයක් නොවේ. එහෙත් තරුණියගෙන් කෙසේවත් බේරීමක් නැතිම තැන

කළ පින් ගෙවුන කල
කවුරුත් වෙන්ව යති බල

යනුවෙන් සුසුම් ලමින් කතන කතනා

සොඳුර කර තිර ණ
මහට සරසව නිසි උවාර ණ යි කිය. මෙසේ කී

විට නව පණක් ලදුවාක් මෙන් ප්‍රබෝධවත් මුහුණකින් යුක්තව බොහෝ ඉක්මන් ස්වභාවයකින් මහට අවශ්‍ය දෙය සූදනම් කරන බැමිණිය පාඨකයාට මවා පෑමට කතු හිමියෝ සමත් වූහ. මහල්ලා කෙසේ හෝ ගමනට පිටත් විය. එහෙත් අඹුසොඬ මේ නාකියා ගමනට පිටත් වී

පැදකුණු කොට එල ද
සිව් තැනක බැස හෙව වැ ද ගමනට පිටත් විය.

කලක් සිහා ඇවිද දාසයන් ගැනීමට තරම් ප්‍රමාණවත් ධනයක් සොයාගත් බමුණා

තමලිය මෙනෙහි කො ට
අද යෙමි සිතා පියස ට

ඉක්මන් කරමින් එන්නේ අඹුව සූදනම් කර දුන් අත්සුනු වළක් ලහ ඉඳ අනුභව කර පැන් බොන්නට ගිය අතර එම අත්සුණු පසුම්බියට රිංගාගත් නයකු සමහ බැඳ කරේ තබාගෙන එන්නේ රුක්දෙව් වදනින් තැතිගෙන සේනක කරා ආය. සේනක පඬිතුමාගේ ප්‍රඥා මහිමය මනාසේ මෙහිදී ප්‍රකටව ඇත. එතුමාගේ ඥානයට පින් සිදු වන්නට බමුණාගේ ජීවිතයත් ධනයත් රැකිණි.

එයින් පසු විවරණය වන්නේ තරුණ බැමිණිය

ගෙහිමි ගෙන් එල        වා
සැක නැතිව නිති නිල        වා
සොර හිමි සමග ඇල        වා

සිටි ආකාරයයි. මහල්ලා මිදුලේ පියවර බලා ගෙට ගොඩනැගී කථා කරද්දී කලබල වූ බැමිණිය

තම සොරකම්        බලා
හිඳි තෙයි හිස සල        සලා

කිපියාක් මෙන් පහනද නිවා සොරහිමි රහසින් පිටකළ ඇ පොදු කාන්තා සමාජයේ පවත්නා එක්තරා පව්වු ගතියක් ප්‍රකට කළාය. මේ අයුරින් සලකා බලන විට මෙහි එන හැම චරිතයක්ම ඉතා උසස් අන්දමින් නිරූපනය වී ඇති බව කිය යුතුය.

සේනක චරිතය නියම ප්‍රඥ වීරයකුගේ චරිතයක් ලෙසත් බමුණා හා තරුණිය—දූෂිත චරිත ඇත්තන් ලෙසත් ඉතාම ප්‍රකටව නිරූපනය වී ඇත. මෙහි චරිත නිරූපනය කෝට්ටේ යුගය අනුව සලකා බලන කල ඉතාම උසස් බැව් නිගමනය කළ හැකිය.

---

" පරස්පරං භාවයන්තඃ
ශ්‍රේයඃ පරමවාප්ස්‍යථ "

" ඔවුනොවුන්ට සැලකිලි දක්වමින්
උසස් තත්ත්වයට පත්විය යුතුය "

---